# සංක්ෂිප්තය

පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක වර්ධනය සඳහා විදුහල්පති විසින් කාල කළමනාකරණය කරගන්නා ආකාරය පිළිබඳව සොයා බැලීම සඳහා දියත් කළ මෙම අධ්‍යයනය ප්‍රධාන අරමුණු 04 ක් ඔස්සේ මෙහෙයවන ලදී. එනම්,

01. විදුහල්පති තම පාසලේ පරිපාලන කටයුතු සඳහා දෛනික, සති, මාසික හා වාර්ෂික වශයෙන් කාල කළමනාකරණය සඳහා සැලසුමක් සාදාගෙන ඇතිදැයි විමසා බැලීම.
02. විදුහල්පතිට තම පාසල තුළ දෛනික රාජකාරි කටයුතු වලින් බැහැරව වෙනත් රාජකාරි කටයුතුවල යෙදීමට සිදුවීමේ දී කාලය කළමනාකරණය කර ගන්නා ආකාරය විමසා බැලීම.
03. එක් එක් විදුහල්පතිවරුනට ආවේණික කාල කළමනාකරණ ක්‍රමවේද තිබේදැයි විමසා බැලීම.
04. තම කාලය නිසි පරිදි කළමනාකරණය නොවීම නිසා විදුහල්පතිවරුන් මුහුණ දෙන ගැටළු විමසා බැලීම.

පාසල සමාජය නමැති මහා පද්ධතිය තුළ පවත්නා එක් ආයතනයකි. පාසලක මුදුන් පමුණුවා ගත යුතු අරමුණු, පරමාර්ථ සහ ඉලක්ක පවතී. මෙම ක්‍රියාවලිය තුළ දී භාවිතයට ගැනෙන ප්‍රධාන සම්පතක් ලෙස කාලය පෙන්වා දිය හැක. කාල කළමනාකරණය සම්බන්ධයෙන් විදුහල්පති මුහුණ දෙන ගැටළු ඒ ඒ පාසලට සාපේක්ෂව විවිධාකාර විය හැකිය. නමුත් අවශ්‍ය හා නිවැරදි උපාය මාර්ගයන් හඳුනාගෙන කාර්යක්ෂමව කාල කළමනාකරණය කිරීමෙන් විදුහල්පතිවරයෙකුට තම පාසලේ ගුණාත්මක වර්ධනය ඉහළ නංවා ගත හැකිවේ.

මෙම අධ්‍යයනයේ දී පළමුවෙන්ම ගැටළුව හැඳින්වීමක් සිදු කළ අතර පර්යේෂණයේ වැදගත්කම හා පර්යේෂණ සීමා මෙහිදී සාකච්ඡා කරන ලදී. එමෙන්ම මෙම අධ්‍යයනයේදී මූලිකවම සිදුකරන ලද සාහිත්‍ය විමර්ශනය අධ්‍යයන ගැටලුව හඳුනා ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය. මෙහිදී අධ්‍යයනයට අදාල න්‍යායාත්මක සාහිත්‍ය විමර්ශනය හා පර්යේෂණ සාහිත්‍යය විමර්ශනය ලෙස කොටස් 2 ක් යටතේ කරුණු ගවේෂණය කරන ලදී.

මෙම අධ්‍යයනයේ ජනගහනය ලෙස රත්නපුර කලාපයේ 1 AB ජාතික, 1 AB පළාත් හා 1 C පළාත් පාසල්වල විදුහල්පතිවරුන් යොදාගන්නා ලදී. අධ්‍යයන නියැදිය තෝරා ගැනීමේදී නියැදිකරණයේ සමානතා ස්ථරායන නියැදීමේ ක්‍රමය යොදා ගන්නා ලදී. එනම් එක් එක් පාසල් වර්ග වල විදුහල්පතිවරුන් අතුරින් සමාන සංඛ්‍යාවක් එනම් විදුහල්පතිවරුන් 04 දෙනා බැගින්

දොළොස් දෙනෙකු නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. අධ්‍යයනයට අදාල තොරතුරු රැස් කිරීම සඳහා එම පාසල්වල නියෝජ්‍ය විදුහල්පතිවරු, ගුරුවරු සහ පාසල් ළමුන්ද යොදා ගන්නා ලදී. මේ අනුව සමස්ත අධ්‍යයන නියැදිය සාමාජිකයින් 264 කින් සමන්විත විය. දත්ත රැස් කිරීමේ මිනුම් උපකරණ ලෙස ප්‍රශ්නාවලී, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා යොදා ගන්නා ලදී. ප්‍රශ්නාවලි විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ සිසුන් වෙත ලබාදෙන ලදී. විදුහල්පති සම්මුඛ සාකච්ඡා නියමාවලියක් අනුව සිදුකරන ලදී. ගුරුවරුන් සමඟ ෂෙඩියුලයක් රහිතව සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. නිරීක්ෂණ ෂෙඩියුලයකට අනුව ක්‍රමානුකූලව සිදුකරන ලදී. ඉහත ක්‍රම මඟින් රැස්කළ දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය හා අර්ථකථනය සඳහා වගු, ප්‍රස්තාර, ප්‍රතිශත ආදිය භාවිතා කරන ලදී.

මෙහිදී අනාවරණය වූ ප්‍රධාන කරුණු කිපයකි. විදුහල්පතිවරු 12 දෙනාම දෛනික හා වාර්ෂික කාල සටහන් වලට අනුව කටයුතු ක්‍රියාත්මක කිරීමට උත්සාහ කර තිබුණි. විදුහල්පතිවරු තම රාජකාරී කාලය අපතේ යන අවස්ථා කිහිපයක් පෙන්වා දී ඇති අතර ඒ අතුරින් විදුහල්පතිවරු 8 දෙනෙක් අධ්‍යාපන නිලධාරීන් ඇතුළු පාසල් ප්‍රජාව මුණ ගැසීම සඳහා තම කාලය අපතේ යන බවටත්, 9 දෙනෙක් තම පාසලේ ගැටුම් නිරාකරණ කටයුතු සඳහා තම කාලය අනවශ්‍යව වැයවන බවටත් ප්‍රතිචාර දැක්වූහ. විදුහල්පතිවරු 9 දෙනෙක් රැස්වීම් වලට සහභාගී වීමට සිදුවීම නිසා කාලය කළමනාකරණය කර ගැනීමට නොහැකි වන බවටත් විදුහල්පතිවරු 7 දෙනෙක් නිරන්තරව කාර්යාල සහ නිලධාරීන්ට තොරතුරු ලබාදීමට සිදුවීම නිසා කාලය කළමනාකරණය කර ගැනීමට නොහැකි වන බවටත් ප්‍රතිචාර දැක්වූහ.

අවසාන වශයෙන් මෙම අධ්‍යයනය මඟින් අනාවරණය කරගත් කරුණු අනුව එළඹුන නිගමන ඉදිරිපත් කළ අතර ගැටළු සහ බාධක ඉවත් කර ගැනීමට අදාල කරගත හැකි යෝජනා මාලාවක්ද ඉදිරිපත් කරන ලදී. මේ අනුව මෙම අධ්‍යයනය තුළින් සොයාගත් කරුණු ඇසුරින් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා විදුහල්පතිවරයෙකු තම කාලය කෙසේ කළමනාකරණය කර ගත යුතු දැයි යම් අවබෝධයක් ලබාගත හැකිවේ. එසේම ජාතික මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදකයින් වන අධ්‍යාපන කොමිෂම, අධ්‍යාපන අමාත්‍යාංශය වැනි ඉහල තලයේ ආයතන මෙම යෝජනා අවධානයට ගන්නේ නම් විදුහල්පතිවරුන් පාසල් තුළ සිදු කරන මෙම භාර දූර කාර්ය භාරය තවදුරටත් කාර්යක්ෂම කර ගැනිමට හැකිවනු ඇත.

University of Colombo Library

# Abstract

The research was done under the title of "The Principals' Time Management of Qualitative Development of the School Education Process." The objectives are,

* Whether the principal has made daily, weekly, monthly and annual time tables for the school administrative activities.
* How principal allocates time for the other activities in and out of the school.
* Whether each principal has his / her own system for time management.
* The problems they face due to lack of a proper time management.

The school is treated as one institution in the greater society. When functioning this institution properly " time " can be indicated as precious resource. The problem face by the principals with regards to the time management can be different from school to school. But identifying necessary and correct strategies a principal can upgrade the school qualitatively through managing the time proficiently.

At the begining of this research there is an introduction about this problem. The importances and the limits of the research were also discussed. The literary review of this research was very useful for the identification of this problem.

The population involved in this study were The principals of 1 AB national schools, 1 AB provincial and 1 C schools. When selecting the research sample purposive and stratified sampling technique was used. Thus 4 principals from each category were selected as sample. This is comprised of 12 principals. So overall population consisted of 264 including principals, deputy principals, teachers and students. Questionnaires, Interviews and Observations were used as tools for data collection. The data were collected through distributing the questionnaires among those who involved in this research. Principals were interviewed according to a module, where as the teachers were interviewed without a module, through Interviews. The observations conducted systematically.

The results were presented in the form of tables, percentages and charts for interpretation.

According to the revealations of this research it's clear that all principals try their best to execute the duties to the daily and annual time tables. But 7 principals show that they have to take use of the working hours to meet the educational officials and school communitiy. 9 principals have responded that they have to waist their time for problem solving. 6 principals respectively confirmed that they have to report data to the higher officials.

So according to the rvealations of this research the principals possibly can take use of the facts for their time management to upgrade the qualitative development of the aforesaid school system. If the ministry of education and commission of education consider these facts revealed by researcher the efficiency of principals could be uplifted.